**ශීර්ෂය 120 - කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශය, කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුම්වලින් හා සැසඳුම් ප්‍රකාශනවලින් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්ය සාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

## 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණය ද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර, ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත් කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය

---

ශීර්ෂය 120 - කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති, රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 ඔක්තෝබර් 05 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලසුම්, ගිණුම් සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන් ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ සිදු කරන ලද විගණනයේ දී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ජේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ජේදයේ සිට 2.9 දක්වා ජේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 127 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටුකර තිබුණු බව නිරීක්ෂණය විය.

| මුදල් රෙගුලාසි ප්‍රකාර 127 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරී එම විධිවිධානයට අනුගත වී නොතිබීම | නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ජේද යොමුව |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි | | | |
| 127 (1) (අ) | නිවැරදිව සහ මූල්‍ය විධිමත් බවෙන් යුක්තව කටයුතු කරන බව තහවුරුවන පරිදි සියළු මූල්‍ය කාර්යයන් සැලසුම් කළ යුතු වීම | 1. ප්‍රසම්පාදන කටයුතු සැලසුම් ප්‍රමාණවත් පරිදි සැලසුම් නොකිරීම. | 2.2.1 |
| | | 2. ලේඛන හා පොත් පවත්වා නොතිබීම. | 2.5 |
| 127 (1) (ආ) | වියදම් සහ රාජ්‍ය ආදායම් එකතු කිරීම පිළිබඳව ප්‍රමාණවත් තරම් පාලනයකට විධිවිධාන සැලසෙන ක්‍රමයක් සම්පාදනය කළ යුතු වීම | 1. අනුකූල නොවීම | 2.6 |
| | | 2. මානව සම්පත් කළමනාකරණයේ අඩුපාඩු | 2.9 |
| 127 (2) | තමාගේ පාලනය යටතේ පවත්නා දෙපාර්තමේන්තුවල එවකට තිබෙන වැය විෂයයන් මෙන්ම අළුතින් හෝ වැඩියෙන් වියදම් කිරීම සඳහා වන යෝජනා සැකසුරුවම්කම හා කාර්යක්ෂමතාවය අතින් අමාත්‍යාංශයේ දී තියුණු පරීක්ෂාවකට භාජනය කිරීම | 1. අරමුණු ඉටුකර නොගැනීම. | 2.1(අ) |
| | | 2. ප්‍රමාණවත් ලෙස ඉටුනොකල ප්‍රධාන කාර්යයන් | 2.1(ආ) |
| | | 3. ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු | 2.2.2 |
| | | 4. අනාර්ථික ගනුදෙනු | 2.4 |

| | | | |
|---|---|---|---|
| 127(3) | ස්වකීය පරිපාලනාත්මක කෘතහස්තතාව හා විචාර බුද්ධිය මෙහෙයවා සුදුසු පරිදි ක්‍රියා කළ හැකි වන පිණිස සැකයක් හෝ උද්ගත වී ඇති සියළු ප්‍රශ්ණ තමා වෙත ඉදිරිපත් වෙන ආකාරයක් සලසා තිබීම. | වත්කම් කළමනාකරණයේ අඩුපාඩු | 2.3 |
| 127(5) | දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුවල ප්‍රතිපාදිත මුදල හා වියදම අතර ඇති සැලකිය යුතු වෙනස්වීම් අමාත්‍යාංශයේ දැඩි ලෙස පරීක්ෂණයට භාජනය කෙරෙන බව | 1. වෙනත් අමාත්‍යාංශ දෙපාර්තමේන්තු ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමේ ඌනතා<br>2. අධි ප්‍රතිපාදන සලසා තිබීම | 2.7(ආ)<br>2.7(අ) |
| 127(7) | නිලධාරීන්ගේ/සේවකයින්ගේ ප්‍රමාදය, නොසැලකිල්ල, වරද හෝ වංචාව නිසා රජයට පාඩු සිදු වී ඇති අවස්ථාවලදී මුදල් රෙගුලාසි 103 සිට 108 දක්වා රෙගුලාසිවල නියම කර ඇති කාර්ය පරිපාටිය ගණන්දීමේ නිලධාරීන් විසින් අනුගමනය කරනු ලබන බවට ද, මුදල් රෙගුලාසි 156(1) අනුව එම පාඩු සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්/සේවකයන් මත අධිභාර පැනවීම ද වගබලා ගැනීම පිණිස විධිවිධාන යොදන ලද්දේනම් තමා වෙත පැවරී ඇති වගකීම්වලින් ගණන්දීමේ නිලධාරියා නිදහස් වූවාක් ලෙස සලකනු ලැබේ. රාජ්‍ය ගිණුම් කාරක සභාව හමුවේ පෙනී සිට තමා වගකීම් දරන දෙපාර්තමේන්තුවල ගිණුම් පැහැදිලි කිරීමෙන් හා සාධාරණීය කිරීමෙන් ගණන්දීමේ නිලධාරියා සමඟ සහාය වීමද ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ රාජකාරී භාරයක් වීම | මතභේදයට තුඩුදෙන ගනුදෙනු | 2.8 |

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 2.1 කාර්යසාධනය

#### කාර්යභාරයන් ඉටු නොකිරීම

**(අ) ප්‍රධාන අරමුණු ඉටු කර නොගැනීම**

ළමා හා කාන්තා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා යහපාලන භාවිතාවන් තහවුරු වන පරිදි අදාළ අවශ්‍යතා සම්පාදනය කිරීම සහ ප්‍රතිපත්ති සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම හා නියාමනය කිරීම අමාත්‍යාංශයේ මෙහෙවර වුවද, ළමා හා කාන්තා අයිතිවාසිකම් තහවුරු කිරීම, ආරක්ෂා කිරීම, ප්‍රවර්ධනය කිරීම සඳහා සම්පාදනය කළ නීති හා සකස් කළ ප්‍රතිපත්ති බලාත්මක කර ක්‍රියාත්මක කර නොතිබුණි.

**(ආ) ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) පෙර පාසල් ගුරුවරුන් 10,000 කට මාසයකට රු.250 බැගින් දීමනාවක් ලබා දීම සඳහා රු.මිලියන 30 ක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණි. එසේ නමුත්, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් දීමනාව ලබා දිය යුතු ගුරුවරියන් හඳුනා ගැනීමට නොහැකි වීම හේතුවෙන් පෙර පාසල් ගුරුවරියන් 5,636 කට පමණක් රු.මිලියන 16.50 ක දීමනාවක් ගෙවා තිබුණි.

(ii) අසරණභාවයට පත් කාන්තාවන් හා දරුවන් සඳහා සුභසාධන හා පුනරුත්ථාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා රැකවරණය ලබා දීම අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයක් වුවද, 2017 වර්ෂය තුළදී අමාත්‍යාංශයේ කාන්තා කම්ටුවේ 1938 දුරකතන අංකයට හා පැමිණිලි මධ්‍යස්ථානයට දිස්ත්‍රික්කවලින් විවිධාකාරයෙන් සිදුවන කාන්තා හිංසන පැමිණිලි 1,514 ක් වාර්තා වී තිබුණි. ඉන් විසඳා ඇති ප්‍රමාණය පිළිබඳ දත්ත පද්ධතියක් නඩත්තු කර නොතිබූ අතර පසුවිපරම් කටයුතු කිරීමක් ද සිදුකර නොතිබුණි. එමෙන්ම 2016 වර්ෂයේ පුවත්පත්වල පල වූ කාන්තා හා ළමා හිංසන, අපයෝජන හා අපචාර ප්‍රමාණය 2456 ක් වූ අතර, 2017 වර්ෂයේ එම ප්‍රමාණය 3046 ක් වූ අතර එය පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 24 ක වර්ධනයක් නිරීක්ෂණය විය.

(iii) 2017 මැයි මස ගංවතුර හා නාය යෑම් හේතුවෙන් විපතට පත් ළමුන් හා කාන්තාවන් වෙනුවෙන් රාජ්‍ය නොවන සංවිධාන, පෞද්ගලික ආයතන හා විවිධ පුද්ගලයන් ද්‍රව්‍යමය ආධාර ලබා දී තිබුණි. 2017 අගෝස්තු 21 දින සිදු කරන ලද භෞතික විගණන පරීක්ෂාවේ දී මෙම ආධාරවලින් විශාල ප්‍රමාණයක් බෙදා හැර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(iv) රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය විසින් 2017 ජූනි 27 දිනැති අංක 540/D/DEV/09/DSC පරිත්‍යාග දරන ලිපිය මඟින් අභ්‍යාස පොත් 6000 ක් ගංවතුරෙන් අවතැන් වූ ළමුන් සඳහා බෙදා දීම සඳහා ලබා දී ඇති අතර, එම පොත් තොගයෙන් පොත් 98 ක් පමණක් ළමුන් 28 දෙනෙකුට බෙදා දී තිබුණි. ඉතිරි පොත් 5902 ක ප්‍රමාණය 2017 අගෝස්තු 16 දින ළමා නිවාසවල පිටත පෙර පාසල් වයසේ ළමුන් වෙත බෙදා දීම සඳහා පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුව වෙත භාර දී තිබුණි.

(v) පරිපූරක ඇස්තමේන්තු මඟින් ගංවතුරින් විපතට පත් ළමයින් හා කාන්තාවන් වෙනුවෙන් අත්‍යවශ්‍ය හදිසි සහන පැකේජ ලබා දීම වෙනුවෙන් ඉල්ලුම් කල ප්‍රතිපාදනවලින් රු.මිලියන 11 ක් සමාලෝචිත වර්ෂය අවසානයට ඉතිරිව තිබුණි.

(vi) සමාලෝචිත වර්ෂය තුළ විදේශගත වීමට අපේක්ෂිත කාන්තාවන් සඳහා විකල්ප ආදායම් උත්පාදන වැඩසටහන සඳහා රු.මිලියන 3.5 ක ප්‍රතිපාදන සලසා තිබුණ අතර, ව්‍යාපෘති 140 ක් සැලසුම් කර තිබුණි. අමාත්‍යාංශය පිළියෙල කළ ප්‍රගති වාර්තාවලට අනුව ප්‍රතිලාභීන් 140 දෙනෙකුට රු.මිලියන 3.497 ක් ලබා දී ඇති බව දක්වා තිබුණ ද, විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරුවලට අනුව ප්‍රතිලාභීන් 108 දෙනෙකුට රු.මිලියන 2.73 ක් පමණක් ලබා දී තිබූ අතර, ඉන් ව්‍යාපෘති 9 ක් අසාර්ථක වී තිබුණි.

(vii) වතුකරයේ කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබල ගැන්වීමේ අරමුණින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා ආහාර නිෂ්පාදනය, කුකුළු පාලනය, එළු පාලනය, මී මැසි පාලනය, මැහුම් සහ රූපලාවන්‍ය ආදී වැඩසටහන් වෙනුවෙන් රු.මිලියන 2.13 ක ප්‍රතිපාදන ප්‍රතිලාභීන් 307 දෙනෙකුට සමාලෝචිත වර්ෂයේදීම ලබා දී තිබුණි. මෙම වැඩසටහන් සඳහා උපකරණ හා සත්ත්ව බීජ, පැටව් ලබා ගැනීම පිළිබඳ අත්සන් ලේඛණ නොතිබුණි. කර්මාන්ත කර ගෙන යාමේ ගැටළු සහ ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වන කාන්තාවන් ආර්ථික වශයෙන් ශක්තිමත් වූවාද යන්න පිළිබඳ පසුවිපරම් ක්‍රියාවලියක් කර නොතිබුණි.

(viii) කාන්තාවන්ගේ ආර්ථික ශක්තිය වර්ධනය කිරීම හා රටේ ආර්ථික සංවර්ධනයෙහිලා කාන්තාවන්ගේ දායකත්වය ලබා දීම අරමුණු කර ගෙන තිරසර කෘෂි ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු.මිලියන 2.2 ක ප්‍රතිපාදන සලසා තිබුණි. බුලත්, ගම්මිරිස්, කුරුඳු, රෝස යන වගාවන් හා ඖෂධ ව්‍යාපෘතිය සඳහා ද, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට රු.මිලියන 2.174 ක ප්‍රතිපාදන ලබා දී තිබුණි. ප්‍රගති වාර්තාවට අනුව කෘෂි ව්‍යාපෘති 20 ක් සඳහා ප්‍රතිලාභීන් 382 දෙනෙකුට ප්‍රතිලාභ ලබා දී ඇති බව දන්වා තිබුණ ද, ප්‍රතිලාභීන් පැළ ලබා ගත් බවට සාක්ෂි නොතිබීම, පැළවල යෝග්‍යතාවය සනාථ කර නොගැනීම, පුහුණු වැඩසටහන් පැවැත් වූ බවට තොරතුරු නොමැති වීම, අය කරන මුදල් නිවැරදිව සටහන් කරන ක්‍රමවේදයක් නොතිබීම, ව්‍යාපෘතිවල ප්‍රගතිය හා පසුවිපරම් කටයුතු සිදු නොකිරීම යන දුර්වලතා නිරීක්ෂණය විය.

(ix) 2017 වර්ෂයේ කාන්තාවන් ආර්ථික හා සාමාජීය වශයෙන් සවිබල ගැන්වීමේ අරමුණින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා වේවැල් නිෂ්පාදනය, බිම්මල් නිෂ්පාදනය, මදුරු දැල් මැසීම හා පාවහන් නිෂ්පාදනය ආදී ව්‍යාපෘති 19 ක් වෙනුවෙන් රු.මිලියන 4.86 ක

ප්‍රතිපාදන ප්‍රතිලාභීන් 343 දෙනෙක් සඳහා බැඳීම් පත්‍ර මඟින් ලබා දී තිබුණි. එසේ වුවද, හතරවැනි කාර්තුවේ ප්‍රගති වාර්තාවට අනුව ව්‍යාපෘති 20 ක් යටතේ ප්‍රතිලාභීන් 576 දෙනෙකු සඳහා රු.මිලියන 4.97 ක් වැය කර ඇති බව දක්වා තිබුණි. පුහුණු වැඩසටහන්වලට සහභාගී වූ බව සනාථ කිරීමට අත්සන් ලේඛණ හා උපකරණ ලබා දුන් බවට හා ප්‍රතිලාභීන් භාරගත් බවට ලිඛිත සාක්ෂි නොතිබුණි. ප්‍රතිලාභීන්ට ලබා දුන් ප්‍රතිපාදනවලින් සියයට 50 ක් වාරික වශයෙන් අයකර ගත යුතු වුවද එම අයකර ගැනීම් පිළිබඳ විස්තර නොතිබුණු අතර, ව්‍යාපෘතියේ ප්‍රගතිය පිළිබඳව මාස 3 කට වරක් වනිතා සංවර්ධන නිලධාරී සහ සහන සොයුරිය විසින් පසුවිපරම් සිදු කර අමාත්‍යාංශය වෙත ප්‍රගති වාර්තා ද ඉදිරිපත් කර නොතිබුණි.

(x) ළමා ආරක්ෂාව සහ ළමා හිමිකම් තහවුරු කිරීම සඳහා රු.මිලියන 4.3 ක් ප්‍රතිපාදන සලසා තිබුණද, 2017 අප්‍රේල් මස මහා භාණ්ඩාගාරයෙන් රු.මිලියන 3 ක මුදලක් අක්මුදල් වශයෙන් අමාත්‍යාංශය වෙත ලැබී තිබුණි. 2017 වර්ෂය සඳහාම ක්‍රියාකාරී සැලැස්ම සකස් කර තිබුණ ද, ඉහත මුදල් වියදම් කිරීම ආරම්භ කර තිබුණේ ජූලි මාසයේ සිට වන අතර, 2017 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 1.1 ක් වියදම් නොකර භාණ්ඩාගාරය වෙත ආපසු යවා තිබුණි.

## 2.2 ප්‍රසම්පාදන ක්‍රියාවලිය මඟින් සැපයීම් හා සේවා ලබා ගැනීම

### 2.2.1 ප්‍රසම්පාදනයන් සැලසුම් කිරීම හා ප්‍රාරම්භක අවධිය

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2 (අ), (ආ) මාර්ගෝපදේශ ප්‍රකාරව ප්‍රසම්පාදන කාර්යයන් සඳහා සවිස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් සහ ප්‍රසම්පාදන කාලසටහනක් පිළියෙල කර නොතිබුණි.

### 2.2.2 ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම

(අ) මුල් ළමාවිය සංවර්ධන නිලධාරින් සඳහා රු.මිලියන 6.7 ක් වටිනා වානේ අල්මාරිමිලදී ගැනීමේ ප්‍රසම්පාදනයේ දී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.6.1 (අ) (ii) මාර්ගෝපදේශය ඡේදය ප්‍රකාරව පිරිවිතර ඇතුළු ලංසු ලේඛණ කෙටුම්පත් සකස් කිරීම, සමාලෝචනය කිරීම හා අනුමත කිරීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත ඉදිරිපත් කර නොතිබුණි. එසේම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.1 මාර්ගෝපදේශය ප්‍රකාරව මිල ගණන් ඉල්ලීම් ප්‍රකාශ තැපැල් කළ බවට හෝ අතින් භාර දුන් බවට තහවුරු කර ගැනීමට සාක්ෂි නොතිබුණි. 6.3.2 මාර්ගෝපදේශයට පටහැනිව ලංසු ආරාධනය හා ලංසු විවෘත කිරීම සිදු කර තිබුණි.

(ආ) මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික සතියට අදාලව සිදු කරන ලද රු.මිලියන 1.17 ක මිලදී ගැනීම් ප්‍රසම්පාදන සැලැසුමට ඇතුළත් කර නොතිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.4 මාර්ගෝපදේශය ප්‍රකාරව ලංසු කැඳවීමේදී භාණ්ඩවල විස්තර ඇතුළත් කර නොතිබුණු අතර ලංසු විවෘත කිරීම සටහන් කිරීම සඳහා නියමිත ආකෘති යොදාගෙන නොතිබුණි. 6.3.3 මාර්ගෝපදේශයට පටහැනිව ලංසු විවෘත කිරීම, පැහැදිලි හේතු දැක්වීමක් නොකර කල් දමා තිබුණි.

(ඇ) විවෘත ආර්ථිකයේ 40 වසරක සංවර්ධනය පිළිබඳ ප්‍රදර්ශනය සමාලෝචිත වර්ෂයේ ජූලි 27 සිට 30 දක්වා දින 4 ක පවත්වා තිබුණි. ඒ සඳහා ප්‍රදර්ශන කුටිය සකස් කිරීම සඳහා ආයතනයක් තෝරා ගැනීමට ලංසු ගණන් කැඳවා තිබුණි. ප්‍රසම්පාදන ක්‍රියාවලියේ පැවති දුර්වලතා නිසා තෝරා ගත් ලංසුකරුට රු.මිලියන 2.19 ක වටිනාකමකට 2017 ජූලි 26 දින ඇණවුම භාර දී තිබුණු අතර 2017 ජූලි 27 දින ප්‍රදර්ශන කුටිය භාර දෙන ලෙස දන්වා තිබුණි. එසේ වුවද, ප්‍රදර්ශන කුටිය ප්‍රදර්ශනයේ දෙවන දිනය වන 2017 ජූලි 28 දින භාර දී තිබුණි.

(ඈ) පිරිවැය ඇස්තමේන්තු අනුමත කිරීමකින් තොරව බංගලා නිල නිවාසයක් සඳහා විදුලි උපාංග හා ගෘහ භාණ්ඩ උපකරණ සවිකිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 7.7 ක් වැය කර තිබුණි. ලංසු ලේඛන කෙටුම්පත් සකස් කිරීම හා ඒවා සමාලෝචනය කිරීම හා අනුමත කිරීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත ඉදිරිපත් කර නොතිබුණි. එසේ පිළිවිතර සමාලෝචනය කිරීම හා අනුමත නොකිරීම, ලංසු විවෘත කිරීමේ කමිටුවක් පත් කර ලංසු විවෘත කර නොතිබීම යනා දී අඩුපාඩු නිරීක්ෂණය විය.

## 2.3 වත්කම් කළමනාකරණය

-------------------------------

### (අ) වාහන අවභාවිතය

--------------------

ළමා කටයුතු ගරු රාජ්‍ය අමාත්‍යතුමියට පවරා තිබූ මොන්ටේරෝ ජීප් රථය 2015 වර්ෂයේ දී අනතුරට භාජනය වී තිබුණි. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති (මධ්‍යම පළාත) විසින් වාහන අනතුර සම්බන්ධව 2016 පෙබරවාරි 19 දිනැති අංක S/DIG/CP/C/417/2015 දරන විමර්ශන වාර්තාව ලබා දී තිබුණි. එම වාර්තාවට අනුව, මෙම වාහනය 2015 මාර්තු 10 දින අනතුරට පත්වන අවස්ථාවේ දී වෙනත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුගේ පෞද්ගලික රියදුරු වශයෙන් කටයුතු කර තිබුණි. ගරු රාජ්‍ය ඇමතිතුමියගේ කාර්යයන් සඳහා ලබා දී තිබූ ඉහත වාහනය වෙනත් මන්ත්‍රීවරයෙකුගේ භාවිතය සඳහා යෙදවීම පිළිබඳව අමාත්‍යාංශය දැනුවත් වී නොතිබුණි.

### (ආ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්

---------------------------------------------

අමාත්‍යාංශය සතු වාහන 17 ක් අවිධිමත් ලෙස බාහිර පාර්ශවයන් වෙත මුදා හැර තිබුණි.

### (ඇ) පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම

---------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අමාත්‍යාංශය විසින් විධිමත් පරිදි බියගම ප්‍රාදේශීය ලේකම්ට අයත් ඉඩම පවරා නොගෙන රු.මිලියන 25 ක් වැය කර 2001 වර්ෂයේ දී බියගම කාන්තා නේවාසිකාගාරයක් ඉදිකර තිබුණු අතර, විගණන දිනය වූ 2018 ජූලි 25 වන විටත් ඉඩම පවරා ගෙන නොතිබුණි.

(ii) වෙනත් අමාත්‍යාංශ සතු වාහන 13 ක් අමාත්‍යාංශය වෙත පවරා ගැනීම සඳහා විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## 2.4 අනාර්ථික ගනුදෙනු

----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ගෘහ ආර්ථිකය ශක්තිමත් කිරීමේ අරමුණින් පන් වගා කිරීමේ ව්‍යාපෘතියක් සඳහා රු.මිලියන 1.53 ක් 2016 වර්ෂයේ දී ඉංගිරිය ප්‍රාදේශීය ලේකම්ට ලබා දී තිබුණි. මෙම මුදල්වලින් රු.608,438 ක් වැය කර පන් මුල් මිලදී ගෙන තිබුණු අතර, රු.12,000 ක් පුහුණු වැඩසටහන් සඳහා වැය කර තිබුණි. නිසි සැලසුමකින් තොරව මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීම නිසා අසාර්ථක වී තිබුණ අතර, වැය කළ මුදල අනාර්ථික වියදමක් ලෙස නිරීක්ෂණය විය.

(ආ) ජාත්‍යන්තර කාන්තා දින ජාතික උත්සවය සැමරීම සඳහා දිරිය කාන්තා වැය විෂයය යටතේ රු.මිලියන 10 ක් හා කාන්තා සවිය වැය විෂයය යටතේ රු.මිලියන 1.00 ක් ද වෙන් කර තිබුණි. මෙම මුදල් වියදම් කරන ආකාරය පිළිබඳව මූළ වියදම් ඇස්තමේන්තුවක් පිළයෙල කර නොතිබුණු අතර, වේදිකා නිර්මාණය, ශබ්ද විකාශන හා මාධ්‍ය කටයුතු සඳහා ද, ආහාරපාන සඳහා ද, මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත බැඳුම් පත්‍ර මඟින් ප්‍රතිපාදන යැවීම සඳහා ද යොදා ගෙන තිබුණි. මෙම මුදල් කාන්තාවන් මුහුණපාන බරපතල සමාජීය හා ආර්ථික ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා තිරසාර ක්‍රමෝපායන් හඳුන්වා දී ක්‍රියාත්මක කිරීම සඳහා වැය කළ හැකිව තිබුණි.

(ඇ) මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ජාතික සතියට අදාලව පහත සඳහන් වැඩසටහන් ක්‍රියාත්මක කර තිබුණු අතර ඒ සඳහා රු.මිලියන 9 ක් වියදම් කර තිබුණි. එසේ වුවත්, දරුවන් මුහුණදෙන බරපතල සමාජ හා ආර්ථික ගැටළු විසඳීම සඳහා මෙම මුදල් යෙදවීමට හැකියාව තිබුණි. (i) ප්‍රතිපත්ති සම්පාදනයන් සඳහා වූ වැඩසටහන, (ii) මුල් ළමාවිය පසුවන දරුවන්, පෙර පාසල් ගුරුවරියන් හා දරුවන්ගේ දෙමාපියන්, ක්ෂේත්‍ර නිලධාරීන්, ගැබිණි මව්වරුන් හා තරුණ කණ්ඩායම් දැනුවත් කිරීමේ වැඩසටහන්, (iii) පෙර පාසල් දරුවන් සඳහා සෞන්දර්යාත්මක වැඩසටහන, (iv) ආදර්ශ ගම්මානයක් තුළ සියළුම ක්‍රියාකාරී කණ්ඩායම් දැනුවත් කිරීමේ වැඩසටහන ද, (v) බැනර හා සටහන් පොත් 1,000 ක් මිලදී ගැනීම (vi) මෙම සතියට සමගාමීව වැඩසටහන් පැවැත්වීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට ප්‍රතිපාදන ලබා දීම ද ඇතුළුව මෙම සතියට අදාලව සමාලෝචිත වර්ෂය තුල රු.මිලියන 9 ක මුදලක් වියදම් කර තිබුණි.

## 2.5 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

----------------------------------------------

අමාත්‍යාංශය විසින් ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණ ඇගැයීම් කමිටුවල පැමිණීමේ ලේඛනය, කමිටු රැස්වීම් වාර්තා සහ ලංසු කැඳවීමේ ලේඛනය රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 2.11.2, 2.11.3 (අ) හා 5.2.1 යන මාර්ගෝපදේශ ප්‍රකාරව පවත්වා නොතිබුණි.

## 2.6 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

----------------------------------------------

2010 මැයි 14 දිනැති අංක සීජ්/1/17/1 දරන රාජ්‍ය වියදම් කළමනාකරණය සම්බන්ධ ජනාධිපති ලේකම් කාර්යාලීය චක්‍රලේඛයේ 3.1 ඡේදය ප්‍රකාරව ගරු අමාත්‍යවරුන් හා නියෝජ්‍ය අමාත්‍යවරුන් සඳහා වෙන් කරන උපරිම නිල වාහන ප්‍රමාණය 3 ක් වුවද, ගරු අමාත්‍යතුමිය වෙත වාහන 4 ක් හා ගරු රාජ්‍ය අමාත්‍යතුමිය වෙත වාහන 4 ක් වෙන් කර දී තිබුණි.

## 2.7 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම

(අ) එක් වැය විෂයයක් සඳහා සලසා ගෙන තිබුණු රු.මිලියන 33.00 ක මුළු ප්‍රතිපාදනයම වියදම් නොකර ඉතිරි කර තිබුණි.

(ආ) වෙනත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් පළාත් පාලන මැතිවරණයට ඉදිරිපත් වන කාන්තා අපේක්ෂිකාවන් පුහුණු කිරීම සඳහා වන වැඩසටහනට පෝස්ටර් මුද්‍රණය කිරීම සඳහා රු.මිලියන 7.1 ක ප්‍රතිපාදන ලබා දී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් රු.මිලියන 1.44 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ලබා දී තිබුණු ප්‍රතිපාදනවලින් රු.මිලියන 5.65 ක් හෙවත් සියයට 79.58 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි. පෝස්ටර් මුද්‍රණය කිරීම සඳහා රු.මිලියන 0.99 ක් වැය කර තිබුණු අතර එම පෝස්ටර් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත යැවීම සඳහා තැපැල් ගාස්තු ලෙස රු.මිලියන 0.45 ක් වැය කර තිබුණි.

## 2.8 මතභේදයට තුඩු දෙන ගනුදෙනු

2017 ජනවාරි 26 දිනැති අංක BD/HRD/120/02/01 දරන අයවැය අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය මඟින් 2017 වර්ෂයේ සිට අතිරේක ප්‍රතිපාදන ලබා දීම සිදු කල නොහැකි බව ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කමිටු පිටපතක් ද සහිතව දන්වා තිබුණද 2016 වර්ෂයේ දී ගරු අමාත්‍යතුමියගේ නිල නිවාසයට ලීබඩු හා උපකරණ මිලදී ගැනීම සඳහා රු.මිලියන 10.14 ක පරිපූරක ප්‍රතිපාදන සලසා තිබුණු අතර, එම ප්‍රතිපාදනවලින් රු.මිලියන 3.7 ක් වැය කර තාප්පයක් ඉදිකර තිබුණු බව නිරීක්ෂණය විය. අමාත්‍යාංශ ලේකම් විසින් අයවැය අධ්‍යක්ෂ ජනරාල් අමතන ලද අංක MWCA/S/S/Ad/ALL/2017 දරන දින රහිත ලිපිය මඟින් ඉහත සඳහන් මුදල් අමාත්‍යතුමියගේ නිල නිවසේ පැන්ට්‍රි කබඩ් සෑදීම සඳහා යොදා ගත් බව දන්වා තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ දී රු.මිලියන 6.4 ක් වූ ඉතිරි පරිපූරක ප්‍රතිපාදන ලබා දී තිබුණු අතර, සමාලෝචිත වර්ෂය තුළ දී පැන්ට්‍රි කබඩ් සෑදීම සඳහා තවත් රු.මිලියන 2.828 ක් වැයකර තිබුණි.

## 2.9 මානව සම්පත් කළමනාකරණය

අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය, පුරප්පාඩු හා අතිරික්ත කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු.මිලියන 604 ක් වැය කර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වියදම රු.472,318 ක් වී තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෝෂ්ඨ මට්ටම | 31 | 25 | 06 |
| (ii) | තෘතියික මට්ටම | 17 | 13 | 04 |
| (iii) | ද්විතියික මට්ටම | 1,437 | 1,174 | 263 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 75 | 65 | 10 |
| (v) | අනියම්/කොන්ත්‍රාත් | 02 | 02 | - |
| | **එකතුව** | **1,562** | **1,279** | **283** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත කරනු ලබන වනිතා සංවර්ධන නිලධාරීන් හා උපදේශන සහකාර නිලධාරී පුරප්පාඩු 263 ක් ලෙස සඳහන් කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත්, සේවයේ නියුතු නිලධාරීන් 1,174 දෙනෙකු වී තිබුණි. එම නිලධාරීන් විසින් සිදු කරනු ලබන කාර්යයන් සම්බන්ධයෙන් නිසි පසුවිපරම් කිරීමක් හා අධීක්ෂණයන් සිදු කර නොතිබුණු අතර, එවා තිබුණු ප්‍රගති වාර්තාවලින් ද ප්‍රමාණවත් කරුණු දැක්වීම් සිදු කර නොතිබුණි.

(ආ) අමාත්‍යාංශයේ ජ්‍යෝෂ්ඨ මට්ටමේ නිලධාරීන් 06 දෙනෙකු සහ තෘතියික මට්ටමේ නිලධාරීන් 04 දෙනෙකුගේ පුරප්පාඩු පැවතීම නිසා ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් සිදු කරනු ලබන අමාත්‍යාංශ කාර්යයන්, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව, ජාතික ළමා ආරක්ෂක අධිකාරිය, ළමා සංවර්ධන අරමුදල, ළමා ලේකම් කාර්යාලය, කාන්තා කාර්යාංශය, කාන්තා කමිටුව සහ සංවර්ධන අංශය ආදියේ කටයුතු සම්බන්ධයෙන් අධීක්ෂණ කටයුතු නිසි පරිදි සිදු කිරීමට නොහැකි වී තිබුණි.

(ඇ) කාර්ය මණ්ඩලය නිතිපතා පුහුණු කිරීම අවශ්‍යතාවක් වුවද, අමාත්‍යාංශයේ 1,279 දෙනෙකු වන තථ්‍ය කාර්ය මණ්ඩලයෙන් පුහුණු වැඩසටහන් 4 ක් සඳහා පමණක් නිලධාරීන් 14 දෙනෙකුට පමණක් පුහුණු වීම් ලබා දී තිබුණි.